## ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව
## යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය

ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ආධුනිකයින් ඇතුලත් කර ගැනීම - 2012 වර්ෂය

2012 වර්ෂය සඳහා ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයට ඇතුලත් කර ගැනීමට පහත සඳහන් අවම සුදුසුකම් සපුරා ඇති ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

1. (අ) **වයස** : 2012.03.31 වැනි දිනට අවුරුදු 16 ත් 22 ත් අතර විය යුතුය.

   (ආ) **අධ්‍යාපන සුදුසුකම්**
   අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී (අධ්‍යයන මාධ්‍යය අනුව) සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළු විෂයයන් 06 ක් එකවර සමත්වීම.

   **විශේෂ කුසලතා** :
   විදුලි/ විද්‍යුත්/යාන්ත්‍රික යන ක්ෂේත්‍රයකින් නව නිර්මාණ ඉදිරිපත් කර නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් පවත්වන පලාත් මට්ටමේ තරඟ වලින් ප්‍රථම ස්ථාන 03 අතරට පැමිණ සහතික ලබා ඇති හෝ ජාතික මට්ටමේ තරඟ වලින් කුශලතා සහතිකයක් හෝ ඊට ඉහල ජයග්‍රහණයක් ලබා ඇති අය ඉහත (ආ) සුදුසුකම දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්පූර්ණ කිරීම ප්‍රමාණවත්ය.

   (ඇ) සැ.යු. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය සමඟ වසර 03 ක් හෝ වැඩි කාලයකට දැනට ගිවිසුම්ගත අය මේ සඳහා ඉල්ලුම් නොකල යුතුය.

2. **පාඨමාලා මාධ්‍යය**
   සියළුම පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පවත්වන අතර මෝටර් කාර්මික ශිල්පය පමණක් දෙමළ මාධ්‍යයෙන් ද පැවැත්වේ.

3. **ඇතුලත් කර ගැනීමේ පරීක්ෂණය**
   අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති හා අංක 04 සඳහන් විභාග ගාස්තු ගෙවා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

   (අ) පවත්වන මාධ්‍යය : සිංහල සහ දෙමළ භාෂා වලින්

   (ආ) විභාග මධ්‍යස්ථාන: කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල, අනුරාධපුරය, ත්‍රිකුණාමලය සහ යාපනය (ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් නොමැති මධ්‍යස්ථානවලින් ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන් ආසන්නම මධ්‍යස්ථානයට යොමු කරනු ඇත.)

   **විභාගයට අදාල විෂයයන්**
   ඇතුලත්වීමේ විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වන අතර ගණිතය, සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය සහ කාර්මික ඇඳීම යන විෂයයන් පදනම් කර සකස් කරනු ලැබේ.

4. **විභාග ගාස්තු** : විභාග ගාස්තු වශයෙන් රු.400/- ක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් පහත ගිණුමට බැර කර ලදුපත අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය.

   **ගිණුම** : ගණකාධිකාරී, ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය. ලංකා බැංකුව, මොරටුව ශාඛාව, ගිණුම් අංක 681490

   විභාග ගාස්තු ගෙවා ලබා ගත් කුවිතාන්සිය අමුණා නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඇතුලත්වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසිම හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

5. **මූලික තෝරාගැනීම**
   ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් ප්‍රමුඛතා පදනම මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම පරීක්ෂණයට අයදුම්කරුවන් කැඳවීමේ දී අඩු පහසුකම් සහිත පළාත් සඳහා තෝරා ගැනීමේ ලකුණු මට්ටම ආයතනය මඟින් තීරණය කරනු ඇත. (අඩු පහසුකම් ඇති ප්‍රදේශ ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නිර්දේශ කරනු ලබන පළාත් පමණක් සලකනු ලැබේ)

6. **අවසන් තෝරා ගැනීම**
   යෝග්‍යතා හා සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ඉහළම ලකුණු ප්‍රමාණය මත අවසන් තෝරා ගැනීම සිදු කරනු ඇත. ලකුණු ලබා දෙනු ලබන්නේ යෝග්‍යතා පරීක්ෂණය සඳහා 40%ක් ද සම්මුඛ පරීක්ෂණය සඳහා 60% ක් ද වශයෙනි. විෂය බාහිර කුසලතා කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

   තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයකට යටත්ව පුහුණුව සඳහා බඳවා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අයදුම්කරුවන් පුහුණුවෙන් ඉවත් කරනු ලබන බව සැලකිය යුතුය.

7. **පුහුණු පාඨමාලා**

| | | |
|---|---|---|
| මෝටර් කාර්මික ශිල්පය | - | අවු. 04 |
| මිල්රයිට් වැද්දුම් ශිල්පය | - | අවු. 04 |
| වායු සමීකරණ/ශීතකරණ ශිල්පය | - | අවු. 03 1/2 |
| බල විදුලි ශිල්පය | - | අවු. 03 1/2 |
| යන්ත්‍රණ ශිල්පය | - | අවු 03 1/2 |
| ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පය | - | අවු. 03 |
| වාහන විදුලි ශිල්පය | - | අවු. 03 |
| පෑස්සුම් ශිල්පය | - | අවු. 03 |
| මෝටර් වාහන, බොඩි අළුත් වැඩියාකරු හා පින්තාරුකරු | - | අවු. 03 |

   මෙම පුහුණු පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දෙනුයේ ප්‍රථම වසරේ දී මූලික පුහුණු පාඨමාලාව අවසානයේ පැවැත්වෙන වෘත්තීය තෝරා ගැනීමේ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවන්ගේ ප්‍රතිඵල අනුවය.

8. **ගිවිසුම් අත්සන් කිරීම**
   ආයතනයේ පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන් ලැබෙන වෘත්තීන්ට අදාලව අවු. 04, 03 1/2 සහ 03 ක් වූ පාඨමාලා සාර්ථක ව හදාරන බවට මෙම ආයතනය සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.
   ඊට අමතරව ආයතනීය සාර්ථක පුහුණුවෙන් පසු අවශ්‍ය වුවහොත් වසර 02 ක් ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවය සඳහා යොමු කරනු ඇත.

9. **අයදුම්පත්**
   පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පතට අනුව A4 ප්‍රමාණයට තම අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුතු අතර අයදුම්පත්‍රය සමඟ පහත දැක්වෙන සහතික වල ඡායා පිටපත් ද අමුණා එවිය යුතුය.
   (අ) උප්පැන්න සහතිකය
   (ආ) අධ්‍යාපන සහතික
   (ඇ) ඉහත අංක 1 හි විශේෂ කුශලතා යටතේ අයදුම් කරන අයදුම්කරුවන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මඟින් නිකුත් කර ඇති පලාත් /ජාතික මට්ටමේ සහතිකය

   අයදුම්පත් එවීමේදී ලියුම් කවරයේ ඉහල වම් කෙලවරේ " පූර්ණ කාලීන ආධුනිකයින් බඳවා ගැනීම - 2012" යනුවෙන් සඳහන් කල යුතුය.
   (අයදුම්පත් www.cgtti.slt.lk දරන ආයතනීය වෙබ් අඩවියෙන්ද ලබා ගත හැකිය.)

10. **අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය**
   අයදුම්පත් 2012.06.20 වන දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ කළමනාකාර - මානව සම්පත් හා පරිපාලන වෙත ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

කළමනාකාර - මානව සම්පත් හා පරිපාලන
ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය
582, ගාලු පාර, ගල්කිස්ස.
(අගුලාන හංදිය අසල)
දුරකථන අංක 0112605625